# පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය

**(වග උත්තරකරු සඳහා තොරතුරු)**

***සමාන අවස්ථා පිළිබඳ කොමිසමේ භූමිකාව***

සමාන අවස්ථා පිළිබඳ කොමිසම ("EOC") යනු ලිංගිකව වෙනස් කොට සැලකීම පිළිබඳ ආඥා පනත ("SDO"), ආබාධිත බව මත වෙනස් කොට සැලකීම පිළිබඳ ආඥා පනත ("DDO"), පවුලේ තත්ත්වය මත වෙනස් කොට සැලකීම පිළිබඳ ආඥා පනත ("FSDO") සහ ජාතිය මත වෙනස් කොට සැලකීම පිළිබඳ ආඥා පනත ("RDO") (සාමූහිකව "ආඥා පනත්") ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත කරන ලදි ව්‍යවස්ථාපිත ආයතනයකි. ආඥා පනත් මගින්, පුද්ගලයන්ගේ ලිංගිකත්වය, විවාහක අවිවාහක බව, ගර්භණී බව, මව් කිරිදීම, ආබාධිත බව, පවුලේ තත්ත්වය හෝ ජාතිය මත පදනම්ව විවිධ කටයුතුවලදී වෙනස් කොට සැලකීමේ නීති විරෝධී ක්‍රියාවන් ගෙනහැර දක්වයි; එමෙන්ම ඒවා ලිංගික හිංසනය, මව් කිරිදීම මත පදනම් හිංසනය, ආබාධිත බව සහ ජාතිය මත පදනම්ව හිංසනය සහ හෙලා දැකීම හා සම්බන්ධ නීති විරෝධී ක්‍රියාවන්ද ගෙන හැර දක්වයි; එමෙන්ම ආඥා පනත යටතේ නීති විරෝධී ලෙස සැලකෙන ඕනෑම ක්‍රියාවකට අදාළ පැමිණිලි විමර්ශනය කිරීමට සහ සමථයකට පත් කිරීමට EOC වෙත බලය ලබා දෙයි.

මෙම ව්‍යවස්ථාපිත භූමිකාව අපක්ෂපාතීව,සාධාරණව සහ විෂය බද්ධව ක්‍රියාත්මක කිරීමට EOC බැඳී සිටී. EOC අපක්ෂපාතී ස්ථාවරයක සිටින අතර කිසිදු පාර්ශ්වයකට පැමිණිලි කිරීම සඳහා උපදෙස් දෙනු නොලැබේ.

EOC පැමිණිල්ලක් සම්බන්ධව කටයුතු කිරීමේදී, සිදු කළ බව කියන නීති විරෝධී ක්‍රියාව ආඥා පනතේ විධි විධාන යටතට ඇතුළත් විය යුතු ය. මෙමගින් අදහස් වන්නේ පැමිණිල්ල EOC හි බලතල සීමාව තුළ තිබිය යුතු බවයි.

***පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් පසුව***

ආඥාපනත යටතේ නීතිවිරෝධී ක්‍රියා පිළිබඳ සියලු චෝදනා, ඒවා පැහැදිලිවම තම බලතලවලින් පිටතට නොමැත්තේ නම්, විමර්ශනය කිරීමටත්,සමථකරණයෙන් පැමිණිල්ල සමථයකට පත් කිරීමට තම උපරිම උත්සාහය භාවිතා කිරීමටත් EOC හට ව්‍යවස්ථාපිත වගකීමක් ඇත.

***පැමිණිල්ලක් විමර්ශනය කිරීම***

EOC තම බලතල යටතට අයත් වන පැමිණිල්ලක් විමර්ශනය කරනු ඇත. විමර්ශනය කිරීමට පත් කර ඇති පැමිණිල්ල භාර නිලධාරියා විසින් වගඋත්තරකරුට එරෙහිව කරන ලද පැමිණිල්ල ඔහුට / ඇයට ලිඛිතව දැනුම් දෙනු ලැබේ. චෝදනා පිළිබඳ විස්තර වගඋත්තරකරුට සපයනු ලබන අතර ඔහුට ඒවාට ප්‍රතිචාර දැක්වීමට සහ ප්‍රතිචාරයට සහාය වන තොරතුරු සැපයීමට අවස්ථාව ලබා දෙනු ඇත. ලබා දෙන ප්‍රතිචාර පැමිණිලිකරුගේ අදහස් ලබා ගැනීමෙ සඳහා ඉදිරිපත් කරනු ලැබේ. විමර්ශන ක්‍රියාවලිය අතරදී පැමිණිල්ල භාර නිලධාරියා සමහර කරුණු සම්බන්ධව පාර්ශ්වයන්ගෙන් පැහැදිලි කිරීම් ඉල්ලා සිටීමට, චෝදනාවලට සහය වන සාක්ෂි හෝ ලේඛනමය සාක්ෂි ඉල්ලා සිටීමට හෝ ඒවාට ප්‍රතිචාර ලෙස විමර්ශනයට සහය විය හැකි තෙවන පාර්ශ්ව ඇමතීමට ඉඩ ඇත.

වගඋත්තරකරුවෙකු විසින් සැපයිය යුතු තොරතුරු වර්ග පැමිණිල්ලේ ස්වභාවය මත රඳා පවතී. රැකියාව සම්බන්ධව මතු කෙරෙන චෝදනාවන්ට අදාළව EOC වෙත වගඋත්තරකරුවෙකු විසින් ඉදිරිපත් කළ හැකි තොරතුරුවලට උදාහරණ වන්නේ -

- සිදු කළ බවට කියන ලද නීති විරෝධී ක්‍රියාවට අදාළව වග උත්තරකරුගේ නිශ්චිත ප්‍රතිචාරය
- කාර්ය සාධන ඇගයීම් වාර්තා
- උපදේශන සටහන්, අවවාද කිරීම් පිළිබඳ සාක්ෂි යනාදිය
- සම්මුඛ පරීක්ෂණ සාරාංශ, වාර්තා
- සම්මුඛ පරීක්ෂණ ප්‍රශ්න
- රැකියා දැන්වීමේ පිටපතක්
- රාජකාරි විස්තරය, කාර්ය නිර්ණායක ලැයිස්තුව
- සමාන අවස්ථා ප්‍රතිපත්තිය, ලිංගික හිංසන ප්‍රතිපත්තිය
- දුක්ගැනවිලි ක්‍රියාපටිපාටිය
- සාක්ෂිකරුවන් සිටීනම් ඔවුන්ගේ නම්, සම්බන්ධතා තොරතුරු සහ ප්‍රකාශ

වගඋත්තරකරු EOC වෙත ඉදිරිපත් කරන ලද ලේඛන / සාක්ෂ්‍යවල මුල් පිටපත් නිසි ලෙස තබා ගත යුතුය.

වගඋත්තරකරුවෙකුට ඔහුගේ/ඇයගේ ක්‍රියාව(න්) නීති විරෝධී නොවන බව පෙන්වීමට ලද හැකි ව්‍යතිරේක ගණනාවක් ආඥා පනත්වල අඩංගු වේ. තමන්ට ව්‍යතිරේකයක් අදාළ වන බව පෙන්වීම වග උත්තරකරුගේ වගකීම වේ.

ආඥා පනත් තුළ ඇති වින්දිතකරණ විධිවිධාන මගින් සාක්ෂිකරුවන් ආරක්ෂා කෙරේ. වග උත්තරකරුගේ ප්‍රතිචාරයන්ට සහය වීම පිණිස සාක්ෂිකරුවන් විසින් ලබා දෙන අදාළ තොරතුරු, පැමිණිල්කරුගේ අදහස් ලබා ගැනීමටත් පැමිණිලිකරුගේ ප්‍රතිචාරයට සහය ලබා ගැනීමට සාක්ෂිකරුවන්ගේ තොරතුරු සඳහා එය එසේම අනෙක් අතටත් ඉදිරිපත් කෙරෙනු ලැබේ. මෙය සිදු කරනු ලබන්නේ සාක්ෂි වෙත ප්‍රතිචාර දැක්වීම සඳහා පාර්ශ්වයන්ට අවස්ථාව ලැබෙන බව තහවුරු කරගැනීමටයි.

EOC විසින් විෂයමූලික ආකාරයෙන් විමර්ශනය සිදු කරනු ඇති අතර සියලුම පැමිණිලි සම්බන්ධයෙන් අපක්ෂපාතී ලෙස කටයුතු කරනු ලබයි. අපක්ෂපාතීත්වය යන්නෙන් හුදෙක් මධ්‍යස්ථව සිටීම හෝ ක්‍රියාවලියෙන් ඈත්ව සිටීම යන්න අදහස් නොවේ. ස්වභාවික යුක්තිය, පාර්ශ්වයන්ගේ අයිතිය සහ නීතිය යටතේ වන බැඳීම, ප්‍රතික්ෂේප කිරීමට ඇති අයිතිය සහ අදහස් ඇසීමට සැලැස්වීමේ අයිතියට ගරු කිරීම, එක් රැස් කරගත් තොරතුරුවලට අදාළ ප්‍රවේශය, පටිපාටිය සාධාරණත්වය සහ ක්‍රියාවලියේ විනිවිද පෙනෙන සුළු බව වෙත නිසි සැලකිල්ල දක්වනු ඇති අතර අපගේ තීරණ සඳහා පදනම් වූ හේතු මොනවාද යන්න පාර්ශ්වයන් දැනුවත් කරනු ඇත.

පැමිණිල්ල භාර නිලධාරියා සමග සම්බන්ධතාව පවත්වා ගැනීම පාර්ශ්වයන්ගේ වගකීම වන අතර ලිපිනය සහ දුරකථන අංකය වැනි තොරතුරුවල වෙනස් වීම් හැකි ඉක්මණින් පැමිණිල්ල භාර නිලධාරියා වෙත දැන්විය යුතුය.

පහත සඳහන් තත්ත්වයන් යටතේදී පැමිණිල්ලක් සම්බන්ධව විමර්ශනයක් සිදු නොකිරීමට හෝ සිදු කෙරෙන විමර්ශනයක් නැවැත්වීමට EOC විසින් තීරණය කළ හැකිය.

- ආඥාපනත්වල විධිවිධානයක් අනුව පැමිණිලි කරන ලද ක්රියාව නීති විරෝධී නොවන්නේ යැයි EOC සෑහීමකට පත්වන විට.
- අදාළ සිදුවීම මගින් දුකට පත් වූ පුද්ගලයා විමර්ශනය සිදු කිරීමට හෝ ඉදිරියට ගෙන යාමට කැමැත්තක් නොදක්වන බව (නැතහොත් නියෝජිතයෙකු හරහා සිදු කෙරෙන පැමිණිල්ලකදී ක්‍රියාවෙන් පීඩාවට පත් කිසිදු කෙනෙක් එසේ කිරීමට කැමැත්තක් නොදක්වන බවට) EOC හට හැඟී යන විට
- ක්‍රියාව සිදුවී මාස 12 කට වඩා වැඩි කාලයක් ඉක්මවා ඇති විට
- නියෝජිත පැමිණිල්ලකදී, අදාළ පැමිණිල්ල නියෝජිත පැමිණිල්ලක් නොවිය යුතු බවට EOC විසින් තීරණය කරන විට (නියෝජිත පැමිණිලි සම්බන්ධව ඇති රීතිවලට අනුව)
- පැමිණිල්ල නිරර්ථක, හිංසාකාරී, වැරදි වැටහීමක් සහිත හෝ හරයෙන් තොර බවට EOC විසින් සලකන විට

පැමිණිල්ල සම්බන්ධව විමර්ශනයක් සිදු නොකිරීමට හෝ විමර්ශනය නැවැත්වීමට EOC විසින් තීරණය කරනු ලබන විටෙක එම තීරණය සහ ඒ සඳහා වන හේතු පැමිණිලිකරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබේ. සමථයකට පත් කිරීමක් හෝ සම්පූර්ණ විමර්ශනයක් සිදු කර නොමැති නම්, සාමාන්‍යයෙන් පැමිණිල්ලේ පැවැත්ම හෝ තීරණ පිළිබඳව වගඋත්තරකරුට දැනුම් දෙනු නොලැබේ.

## *SDO / DDO / FSDO / RDO* (විමර්ශන සහ සමථකරණ) රීති

මෙම රීතිවල 5(1) වගන්තිය යටතේ කිසියම් ක්‍රියාවක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීම සඳහා සහ කරුණක් නිරාකරණය කිරීමට උත්සාහ දැරීම සඳහා නිශ්චිත තොරතුරු ලිඛිතව ඉදිරිපත් කරන ලෙස ඕනෑම පුද්ගලයෙකුට දැනුම් දිය හැකිය. නිකුත් කරන ලද ලිඛිත දැන්වීමකට සාධාරණ හේතුවක් යටතේ මිස අනුගත වීමට අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂේප කිරීම, 4 වන මට්ටමේ දණ්ඩනයක් (එනම්. HK$10,001 සිට $25,000 දක්වා) පැනවිය හැකි නඩු පැවරීමකට හේතු වනු ඇත

***විමර්ශනයේ රහස්‍යභාවය***

විමර්ශන ක්‍රියාවලිය තුළ ලබාගත් තොරතුරු, EOC විසින් පැමිණිල්ල සම්බන්ධ කටයුතු සඳහා සහ වෙනත් අදාළ අරමුණු සඳහා යොදාගනු ලැබේ. අදාළ තොරතුරු සහ වෙනත් දේ පාර්ශ්වයන්ට සහ සාක්ෂිකරුවන්ට ඔවුන්ගේ අදහස් පළ කිරීම සඳහා ඉදිරිපත් කරනු ඇති නමුත් පැමිණිල්ලේ විමර්ශනයට සම්බන්ධ නැති පුද්ගලයන්ට හෝ මහජනතාවට එම තොරතුරු හෙළිදරව් කරනු නොලැබේ.

රහස්‍යභාවය පිළිබඳ මූලධර්මය අනුගමනය කරන ලෙස පැමිණිල්ලේ පාර්ශ්වයන්ගෙන් තදින් ඉල්ලා සිටිනු ලැබේ. විමර්ශනය අතරතුර ලබාගත් හෝ හුවමාරු වූ තොරතුරු මහජනයාට හෝ පැමිණිල්ලේ විමර්ශනයට සම්බන්ධ නැති පුද්ගලයන්ට හෙළිදරව් නොකළ යුතු අතර ඒවා භාවිතා කළ හැක්කේ EOC මගින් සිදු කරන විමර්ශනයේ අරමුණ සඳහා හෝ ආඥා පනත් යටතේ, පසුව සිදුවන නීතිමය ක්‍රියාපටිපාටීන් සඳහා පමණි. එවැනි තොරතුරු හෙළිදරව් කිරීම විමර්ශනයට හිතකර නොවන අතර ගැටළුව නිරාකරණය කරගැනීම කෙරෙහි යහපත් බලපෑමක් ඇති නොකරයි.

පාර්ශ්වයන් හට සමථයකට පැමිණීමට නොහැකිව පැමිණිල්ල අධිකරණය හමුවට පමුණුවන්නේ නම්, විමර්ශනය අතරතුර ලබාගත් තොරතුරු අධිකරණ ක්‍රියාවලියේ සාක්ෂි ලෙස භාවිතා කළ හැකිය.

**සමථකරණය**

EOC හි පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණයේ මූලික අරමුණ වන්නේ සමථය තුළින් පැමිණිල්ලේ පාර්ශ්වයන්ට ඉක්මන් විසඳුමක් ලබා දීමයි. එබැවින් මුල් අදියරේදී, නිසි යැයි හැඟෙන්නේ නම්, දීර්ඝ විමර්ශන ක්‍රියාවලියකට එළඹීමකින් තොරව මතභේදය සමථයකට පත් කරගැනීම සම්බන්ධව සලකා බලන ලෙස දිරිගන්වනු ලැබේ. සමථයට පත් කිරීමේ මුල් පියවරේදී විමර්ශනය අත් හිටුවන අතර, සමථයට පත් වීම අසාර්ථක වුවහොත් නැවත ආරම්භ කරනු ලබයි. ඉන්පසු පූර්ණ විමර්ශනයක් සිදු කරන අතර EOC විසින් සුදුසු බවට සලකන්නේ නම් නැවතත් සමථකට පත් වීමට යෝජනා කරනු ලැබේ. සමථ කිරීමේ අරමුණු සඳහා, සමථ නිලධාරියා වශයෙන් පැමිණිල්ල භාර නිලධාරියා කිසිදු පාර්ශ්වයක් වෙනුවෙන් පෙනී නොසිටින අතර සන්නිවේදන පහසුකම් සපයන්නෙකු ලෙස කටයුතු කරනු ඇත. නඩු නිලධාරියාගේ කාර්යභාරය වන්නේ පැමිණිල්ලට තුඩු දුන් ගැටළු පරීක්ෂා කිරීම, එකඟතාවයට පත් වන කරුණු හඳුනා ගැනීම සහ පැමිණිල්ල විසඳීමට උත්සාහ කිරීමේදී විසඳුමකට පැමිණීම සඳහා දෙපාර්ශවයටම සහාය වීමයි.

සමථයට පත් කිරීමේ වාසිය වන්නේ වෙනත් ආකාරයේ සහන ලබාගැනීමට වඩා එය වේගවත් විසඳුමක් වීමයි. ඒ සඳහා සාමාන්‍යයෙන් අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සම්බන්ධ වන අතර රහස්‍යභාවය සහතික කරගැනීම පහසු ය. EOC විසින් සිදු කරන සමථකරණ ක්‍රියාවලිය ගාස්තුවකින් තොරවන බැවින් විසඳුමකට එළඹෙන පාර්ශ්වයන්ට ඒ සඳහා කිසිදු වියදමක් වැය නොවනු ඇත, නැතහොත් වැය වන්නේ සුළු මුදලක් පමණි.

EOC හට අනිවාර්ය සමථකරණ සාකච්ඡාවක් කැඳවීමට බලය තිබුණ ද දෙපාර්ශ්වයෙන්ම සමථය සඳහා ඉදිරිපත් වීම සම්පූර්ණයෙන්ම ස්වේච්ඡා ක්‍රියාවකි. කෙසේ වෙතත්, එකඟතාවකට පැමිණෙන ලෙසට කිසිදු පාර්ශ්වයකට බල කිරීමට EOC හට නොහැකි ය. EOC විසින් එකඟතා නියමයන් ලබා දෙන්නේද නැත. ඒවා පාර්ශ්වයන් අතර සාකච්ඡා කරගත හැකිය.

අන්‍යෝන්‍ය එකඟතාවකට එළඹෙන්නේ නම්, ගිවිසුමේ නියමයන් ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර පාර්ශ්වයන් විසින් එයට අත්සන් තැබිය යුතු ය. සමථ ගිවිසුම පාර්ශ්වයන්ගේ ගිවිසුමට බැඳී ඇති අතර තීරණාත්මක වේ. නිරාකරණයන් විවිධ ස්වරූපයෙන් සිදු විය හැකි අතර සමාව ඉල්ලීම, මුදලක් ගෙවීම හෝ යම් ක්‍රියාමාර්ග ගැනීම යනාදිය ඇතුළත් විය හැකිය. වඩා යහපත් නිරාකරණයකට එළඹීමට සහ ඒ සඳහා උත්සාහ දැරීමට EOC විසින් පාර්ශ්වයන්ට සහය ලබා දෙයි.

සමථයට පත් වන්නේ සම්පූර්ණ විමර්ශනයකින් පසුව නමුත් නිරාකරණය කරගැනීමට අපහසු වන අවස්ථාවකදී නම්, නීතිමය සහය වැනි වෙනත් ආකාරයේ සහයන්, එය ඉල්ලා සිටින පැමිණිලිකරුවෙකු වෙත EOC විසින් ලබා දෙනු ඇත. EOC විසින් සියලුම අයදුම් පත්‍ර වෙන වෙනම ඇගයීමට ලක් කර අතර සුදුසු බවට සැලකෙන පැමිණිලිකරුවන්ට නිසි සහය හෝ උපදෙස් ලබා දෙනු ඇත.

**සමථකරණයේ රහස්‍යභාවය**

සමථකරණ ක්‍රියාවලිය තුළ ලැබෙන සියලු තොරතුරු රහස්‍ය වන අතර එම තොරතුරු ලබා දෙන්නාගේ කැමැත්ත සහිතව මිස ඒවා අනාවරණය කරනු නොලැබේ. රහස්‍යභාවය කඩ කිරීම අදාළ කරුණ නිරාකරණයට පත් කිරීමට යහපත් ලෙස බලපාන්නේ නැත. එවැනි තොරතුරු අධිකරණ කටයුතුවලදී **සාක්ෂි ලෙස පිළිගත නොහැකි බව කරුණාවෙන් සලකන්න.**

**වෙනත් ප්‍රතිකර්ම**

ආඥා පනත් අනුව, සිදු වූ බව කියන ක්‍රියාවෙන් මාස 24ක් ඇතුළත පැමිණිලිකරුට දිසා අධිකරණයේ සිවිල් නඩු පැවරිය හැකිය. මෙය EOC වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට විකල්පයක් ලෙස සිදු කළ හැකිය.

***පුද්ගලික දත්ත***

ඉදිරිපත් කරන ලද සියලුම පුද්ගලික දත්ත භාවිතා කරනු ලබන්නේ EOC එහි ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරීම සඳහා පමණි පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ඔවුන්ගේ පුද්ගලික දත්ත වෙත ප්‍රවේශය සහ නිවැරදි කිරීම ඉල්ලා සිටීමට දත්ත මගින් අනාවරණය විය හැකි පුද්ගලයන්ට අයිතිය ඇත. පුද්ගලික දත්ත (පුද්ගලිකත්වය) ආඥාපනත යටතේ, පුද්ගලික දත්ත වලට ප්‍රවේශ වීම සහ / හෝ නිවැරදි කිරීම සඳහා ඕනෑම විධිමත් ඉල්ලීමක් EOC හි අධ්‍යක්ෂ (පැමිණිලි සේවා) වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් කරන ලද පුද්ගලික දත්ත, පැමිණිල්ල සැකසීම හා සම්බන්ධ පාර්ශ්වයන්ට ලබා දීමට ඉඩ ඇත. සපයනු ලබන තොරතුරු පැමිණිල්ලට අදාළ පාර්ශ්වයන්ටද අනාවරණය කිරීමට හෝ සේවාව වැඩි දියුණු කිරීමේ පර්යේෂණ සිදු කිරීම සඳහා EOC විසින් සම්බන්ධ කරගත් නීති බලාත්මක කිරීමේ නියෝජිතායතන සහ වෘත්තීමය උපදේශකයන්/ නියෝජිතයන් ඇතුළු එහෙත් එයට සීමා නොවූ බලය ලත් පුද්ගලයන්ට ලබා දීමට ඉඩ ඇත. පුද්ගලික දත්ත, ඒවා භාවිතා කළ යුතු අරමුණ (සෘජුවම සම්බන්ධ ඕනෑම අරමුණක් ඇතුළුව) ඉටු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි කාලයක් තබා නොගනු ඇත. විස්තර සඳහා කරුණාකර EOC වෙබ් අඩවියෙහි *පුද්ගලික තොරතුරු එක් රැස් කිරීමේ ප්‍රකාශය සහ* පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති ප්‍රකාශය බලන්න (https://www.eoc.org.hk/en/about-the-eoc/eoc-policies/personal-information-collection).